# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1992 අංක 57 දරන කඩවත තරුණ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 නොවැම්බර් මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. | තැපැල් ගාස්තුව රු. 1.00 යි.

## 1992 අංක 57 දරන කඩවත තරුණ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත.

[සහතිකය සටහන් කළේ 1992 නොවැම්බර් මස 13 වන දින]

එල්. ඩී.—ඕ. 35/91

### කඩවත තරුණ බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"කඩවත තරුණ බෞද්ධ සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතියේ සාමාජික යන් එකඟ වූ රීති අනුව එකී සමිතියට සම්බන්ධ සියලු පරමාර්ථ හා කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කඩවත පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් සහ එකී සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1\. මේ පනත 1992 අංක 57 දරන කඩවත තරුණ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

(මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) කඩවත තරුණ බෞද්ධ සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව, (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "කඩවත තරුණ බෞද්ධ සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තවද ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද එම නාමයෙන් සියලු අධිකරණයන් හි නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමට හා පාවිච්චි කිරීමට ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. කඩවත තරුණ බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම.

3\. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත දැක්වෙන පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) සම්බුද්ධ ශාසනය සුරක්ෂිතව පවත්වාගෙන යාම සහ බුදු දහම් පැතිරවීම සඳහා පහසුකම් සැලසීම ;

(ආ) බෞද්ධ ප්‍රතිපත්තිවලට අනුකූලව ජීවත්වීමට සාමාජිකයන්ට ධෛර්යදීම ;

(ඇ) බෞද්ධ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා බෞද්ධයන් අතර එක්සත් බව වර්ධනය කිරීම ;

(ඈ) සමාජයේ සදාචාර, සංස්කෘතික, අධ්‍යාපනික හා සෞඛ්‍ය සංරක්ෂණය සහ සංවර්ධනය ඇති කිරීම උදෙසා අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීම ;

(ඉ) වෘත්තීය පුහුණුව, මාර්ගෝපදේශකත්වය සහ මූල්‍ය ආධාර අවශ්‍ය තැනැත්තන්ට ඒවා ලබා දීමට කටයුතු පිළියෙල කිරීම;

(ඊ) ධර්ම ඥානය නංවාලීමට පහසුකම් සැපයීම; සහ

(උ) බෞද්ධ ආගමික ප්‍රතිපත්ති හා පිළිවෙත් ප්‍රගුණ කිරීමට අවශ්‍ය පූජනීය මධ්‍යස්ථානයක් ගොඩනැගීම, ඊට අවශ්‍ය දේ සැපයීම සහ එය නඩත්තු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබාගැනීම, ආධාර මුදල් හා පරිත්‍යාග පිළිගැනීම හෝ එකතු කිරීම සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලු ම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටු කර ගැනීම සඳහා සහ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාවට බලය ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ නිලධාරීන්ගෙන් ද රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් ද සමන්විත කළමනාකාර මණ්ඩලයක් විසින් සංස්ථාවේ රීතිවලට යටත් ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේදී ධුර දරන සංගමයේ කළමනාකාර මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ යම් මහා සභා රැස්වීමකට පැමිණ සිටින සහ ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයන්ගෙ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යනුකූල වන්නේ ය :—

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ ඔවුන් සාමාජිකත්වයෙන් නෙරපීම;

(ආ) නිලධරයන් තෝරා පත්කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධුරය හිස් කිරීම හෝ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය;

(ඇ) කළමනාකරණ සභාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ කළමනාකරණ සභාවේ බලතල, චර්යාව සහ කාර්ය;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව සහ කර්තව්‍ය.

(ඉ) කළමනාකරණ සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම් කැඳවීම, රැස්වීම් පවත්වන වේලාවන්, ස්ථාන, රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය කිරීම ; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාවේ කවර වුව ද රීතියක් (1) වන උපවගන්තිය යටතේ ඒ රීතිය සාදනු ලැබූ ආකාරයෙන්ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සමිතියෙන් ගෙවිය යුතු සහ සමිතියට අයවිය යුතු ණය.**

7. මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී සමිතියේ පැවති සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට සමිතියට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සහභාගි මුදල් මේ පනතේ කාර්ය සඳහා මෙයින් ඇති කරන ලද සංස්ථාවට ගෙවිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.**

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගෙන තබා ගැනීමට නීතියෙහි ලා සංස්ථාවට බලය ඇති අතර, ඒ සියලු දේපළ ඒවා විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව ගෙවිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

9. සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ ගරු ප්‍රධාන ලේකම්වරයාගේ භාරයේ තබා ගත යුතු ය. ගරු ප්‍රධාන ලේකම් සහ සභාපතිවරයා හෝ ගරු භාණ්ඩාගාරිකවරයා යන දෙදෙනාගෙන් කෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර ඔවුන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන වෙනත් තැනැත්තන්ගේ හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 890 යි (විදේශීය) රු. 1,170 යි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.